දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NA/07/02/2020
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2020.08.12
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

සියලුම අයදුම්කරුවන්ගේ දැනගැනීම සඳහා

## <u>සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2019</u>

2020.02.28 දිනැති අංක 2165 දරණ ගැසට් නිවේදනයට අදාලව හෙද පුහුණුවට බඳවා ගැනීම සඳහා අයදුම් කරන ලද 2017/2018 වර්ෂවලදී විද්‍යාව හා ගණිතය විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ සමතුන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණ පහත දැක්වෙන දිනයන්හිදී හා ස්ථානයන්හිදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

| දිස්ත්‍රික්කය | සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන ස්ථානය | සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දිනය |
|---|---|---|
| අනුරාධපුර<br>පොළොන්නරුව<br>පුත්තලම | හෙද විදුහල අනුරාධපුර | 2020.08.22,23 |
| කුරුණෑගල | හෙද විදුහල කුරුණෑගල | 2020.08.29,30 |
| ගම්පහ<br>කළුතර<br>කොළඹ | සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ 10 | 2020.09.05.06 |
| ගාල්ල | හෙද විදුහල ගාල්ල | 2020.09.12,13 |
| බදුල්ල<br>මොණරාගල | හෙද විදුහල බදුල්ල | 2020.09.19,20 |
| Killinochchi<br>Mullaitivu<br>Vavuniya<br>Mannar<br>Jaffna | Nursing Training School - Jaffna | 2020.09.26,27 |
| මාතර<br>හම්බන්තොට | හෙද විදුහල ගාල්ල | 2020.10.03,04 |
| අම්පාර | හෙද විදුහල අම්පාර | 2020.10.10,11 |
| මඩකලපුව<br>ත්‍රිකුණාමලය | හෙද විදුහල මඩකලපුව | |
| කෑගල්ල<br>රත්නපුර | හෙද විදුහල රත්නපුර | 2020.10.17,18 |
| මහනුවර<br>මාතලේ | හෙද විදුහල මහනුවර | 2020.10.24,25 |
| නුවරඑළිය | මහ රෝහල නුවරඑළිය | 2020.10.31<br>2020.11.01 |

සම්මුඛ පරීක්ෂණ සඳහා පැමිණීමේ දී පහත දැක්වෙන සහතිකවල මුල් ලේඛනය හා තමා විසින්ම සත්‍ය බවට සනාථ කරන ලද ඡායා පිටපත් රැගෙන පැමිණිය යුතුය.

I. උප්පැන්න සහතිකය
II. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය
III. අයදුම් කළ වර්ෂයට අදාළ අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵල ලේඛන හා Z අගය දැක්වෙන සහතිකය. (විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු ලබන අතර පාසල්වල විදුහල්පතිවරුන් විසින් නිකුත් කරනු ලබන සහතික සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු නොලැබේ.)
IV. අ.පො.ස (සා/පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකය. (උ/පෙළ) විභාග ප්‍රතිඵල ලේඛන හා Z අගය දැක්වෙන සහතිකය. (විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු ලබන අතර පාසල්වල විදුහල්පතිවරුන් විසින් නිකුත් කරනු ලබන සහතික සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු නොලැබේ.)
V. අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්. දිවුරුම් ප්‍රකාශයේ රු.50/- ක මුද්දර අලවා ඒ මත අත්සන් කළ යුතුය.
VI. විශ්ව විද්‍යාලයක හෝ වෙනත් රජයේ / සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ පාඨමාලාවකට ලියාපදිංචි වී හෝ සහභාගී නොවන බවට ඔබගේ බහුමාන සහතිකය.
VII. උප්පැන්න සහතිකය හා අධ්‍යාපන සහතික හෝ වෙනත් ලේඛන වල සඳහන් නම්වල වෙනසක් ඇත්නම් සාමදාන විනිශ්චකරුවකු ඉදිරියේ අත්සන් කරන ලද දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. (දිව්රුම් ප්‍රකාශයේ රු.50/- මුද්දරයක් අලවා ඒ මත අත්සන් කළ යුතුය.)
VIII. 2020.05.15 දිනට පූර්වාසන්න වසර තුනක් තුළ අදාල දිස්ත්‍රික්කයේ අඛණ්ඩව පදිංචි වී සිටි බව සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළ යුතුය.

ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කල නොහැකි අවස්ථාවලදී පමණක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබා ගත් පූර්වාසන්න වසර 03 ක ඡන්ද හිමි නාම ලේඛන වල උපුටන ඉදිරිපත් කළ යුතුය.
(ඔබගේ නම ඡන්ද නාම ලේඛනයේ නොමැති නම් ඔබගේ දෙමාපියන්ගේ නම් එහි ඇතුලත් විය යුතුය. එවැනි අයදුම්කරුවකු ඡන්ද නාම ලේඛනවල පිටපත්වලට අමතරව අයදුම්කරු ඡන්ද නාම ලේඛනයේ නම සඳහන් දෙමාපියන්ගේ දුව හෝ පුතා බව සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය.)

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත ගැසට් නිවේදනයේ විධිවිධානවලට අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ. මෙය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් පමණි. සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ පමණින් ඔබ අනිවාර්යයෙන් පුහුණුවට බඳවා ගන්නා බවක් මින් අදහස් නොවන බව සැලකිය යුතුය. සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ / නුසුදුසු වූ හා තෝරා ගන්නා / තෝරා නොගන්නා අයදුම්කරුවන් පිළිබඳව තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ පල කරනු ලබන අතර **කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.**

එච්.ඒ. කමල් පුෂ්පකුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 02
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

**එච්. ඒ. කමල් පුෂ්පකුමාර**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 02**
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.